පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය **10**

දෙවන වාර පරීක්ෂණය - 2019

| 63 | S | I, II |
|---|---|---|

පාසලේ නම : ..................................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ..............................................................

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.** කාලය : පැය 03 යි.

# වෘවසායකත්ව අධ්‍යයනය I, II

## වෘවසායකත්ව අධ්‍යයනය I

**සැලකිය යුතුයි :**

❖ **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

❖ අංක 01 සිට **25** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා, ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ **(x)** ලකුණ යොදන්න.

01. ව්‍යවසායකත්වය යන්න වඩාත් හොඳින් පැහැදිලි කරන ප්‍රකාශය වන්නේ,
    (1) නිෂ්පාදන සාධක නිෂ්පාදන ක්‍රියාවලියට යොමු කිරීමේ හැකියාවයි.
    (2) ව්‍යාපාර අවදානම් භාරගැනීමට ඇති හැකියාවයි.
    (3) පරිසරයේ ඇති අවස්ථා හඳුනාගනිමින් නව ව්‍යාපාර බිහිකිරීමට ඇති හැකියාවයි.
    (4) ආයතනයේ සම්පත් කළමනාකරණය කිරීමේ හැකියාවයි.

02. රටක ආර්ථිකය සංවර්ධනය කෙරෙහි විශාල දායකත්වයක් සපයනු ලබන්නේ ව්‍යවසායකයන් විසිනි. ඉහත ප්‍රකාශයට **නොගැළපෙන** ප්‍රකාශය වන්නේ,
    (1) ප්‍රාදේශීය සංවර්ධනයට දායක වේ.
    (2) ආදායම් බෙදීයාමේ විෂමතා වැඩි කිරීමට දායක වේ.
    (3) නව රැකියා බිහිකිරීමට දායක වේ.
    (4) නව භාණ්ඩ හා සේවා බිහිකිරීමට දායක වේ.

03. ව්‍යවසායකත්ව ගති ලක්ෂණ පමණක් ඇතුළත් වන්නේ,
    (1) නිර්මාණශීලිත්වය, නවෝත්පාදනය, අවදානම් දැරීම, පරාධීනත්වය
    (2) නවෝත්පාදනය, අවදානම් දැරීම, පරාධීනත්වය, නම්‍යශීලිත්වය
    (3) නවෝත්පාදනය, අවදානම් දැරීම, නම්‍යශීලිත්වය, සුභවාදී වීම
    (4) නවෝත්පාදනය, අවදානම් දැරීම, නම්‍යශීලිත්වය, පහසු අරමුණු ඉටු කරගැනීමට ඇති නැඹුරුව

Education NCP - www.edncp.lk

04. නිර්මාණශීලිත්වය වර්ධනය කරගත හැක්කේ,

(1) කුතුහලය දිරිමත් නොකිරීම (2) විවිධත්ව ග්‍රහණය කර නොගැනීම

(3) ගැටළු අභියෝග ලෙස නොදැකීම (4) අසාර්ථකත්ව ඉවසීම

05. ව්‍යවසායකයකු තම අභිමතය පරිදි සිය හැකියාවන් යොදා ගනිමින් කටයුතු කරයි. මෙය හැඳින්විය හැක්කේ,

(1) දැක්ම ලෙස ය. (2) නවෝත්පාදනය ලෙස ය.

(3) ස්වාධීනත්වය ලෙස ය. (4) අවිනිශ්චිතතාව ලෙස ය.

06. සචිතා වියළි මල් හා ශාක කොටස් යොදාගනිමින් විසිතුරු බිත්ති සැරසිලි නිර්මාණය කරයි. ඇය තුළින් මතුවන ව්‍යවසායකත්ව ගුණාංගය වන්නේ,

(1) අනාගත දැක්ම (2) සුභවාදී බව

(3) නිර්මාණශීලිත්වය (4) ස්වාධීනත්වය

07. අවශ්‍යතා හා වුවමනා සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය වන්නේ,

(1) අවශ්‍යතා අසීමිත වන අතර වුවමනා සීමිත වේ.

(2) අවශ්‍යතා සියලුම දෙනාට පොදු වන අතර වුවමනා පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.

(3) අවශ්‍යතා මූලිකව පැන නගින අතර අවශ්‍යතාව මතු වූ පසුව වුවමනා පැන නගියි.

(4) උත්පත්තියත් සමග අවශ්‍යතා ඇති වන අතර වුවමනා පුද්ගලයන් නිර්මාණය කරති.

08. වැඩිහිටි සුභසාධන ආයතනයක හිමිකරු අයත් වන්නේ,

(1) ව්‍යාපාර ව්‍යවසායකයන් ගණයට ය. (2) ආයතනික ව්‍යවසායකයන් ගණයට ය.

(3) සමාජීය ව්‍යවසායකයන් ගණයට ය. (4) ප්‍රාදේශීය ව්‍යවසායකයන් ගණයට ය.

09. ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර සමානකමක් **නොවන්නේ**,

(1) නිර්මාණශීලීව ගැටළු විසඳයි. (2) ආර්ථික කටයුත්තක යෙදෙයි.

(3) අවදානමකට මුහුණ දෙයි. (4) තරගයකට මුහුණ දෙයි.

10. ආයතනික ව්‍යවසායකයෙකුගේ කාර්යභාරය වන්නේ,

(1) ලාභ අපේක්ෂාවෙන් කටයුතු කිරීම

(2) සමාජයේ ප්‍රශ්නවලට නිර්මාණාත්මක විසඳුම් ඉදිරිපත් කිරීම

(3) වඩාත් යහපත් සේවාවක් ලබාදෙන ආකාරයට තම ආයතනය වෙනස් කිරීම

(4) තම ආයතනයේ ශාඛා විවිධ ප්‍රදේශවල ව්‍යාප්ත කිරීම

11. නිමේෂා තමාගේම ඇඟළුම් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ඒ තුළින් ඇයට හිමිවන ප්‍රතිලාභයක් වන්නේ,

(1) ස්වයංපෝෂිත බව (2) කාර්යයන්හි විවිධත්වයක් ඇති නොවීම

(3) තෘප්තිය අවම වීම (4) ආකර්ශණීය ලාභයක් නොලැබීම

12. ව්‍යවසායකයා .................................. දේශීය ආර්ථිකය සංවර්ධනයට දායක වේ. ඉහත හිස්තැනට වඩාත්ම ගැළපෙන පිළිතුර වනුයේ,

(1) ලාභයක් ඉපැයීම තුළින් (2) රැකියා අවස්ථා ජනනය කිරීම තුළින්

(3) ස්වයංපෝෂිත බව තුළින් (4) කාර්යයන්හි විවිධත්වයක් ඇති වීම තුළින්

Education NCP - www.edncp.lk

13. ව්‍යවසායකයකුට සමාජීය සුභසාධනය සඳහා දායක විය හැකි ආකාරයක් වන්නේ,

(1) රාජ්‍ය දිරිගැන්වීම් ලබාගැනීම තුළින්
(2) හදිසි ස්වභාවික විපත්වලදී උපකාරී වීම
(3) සමාජීය වශයෙන් පිළිගැනීමක් ලබාගැනීම
(4) සේවකයින් බඳවා නොගැනීම තුළින්

14. රැකියා නියුක්තිකයෙකු වීමට වඩා ව්‍යවසායකයකු වීමේ ප්‍රතිලාභයක් වන්නේ,

(1) ආකර්ශනීය වැටුපක් ලැබීම
(2) රැකියා උසස්වීම් ලබාගත හැකි වීම
(3) නිදහස හා ඉහළ තෘප්තියක් ලැබිය හැකි වීම
(4) කාර්යයන්හි ඒකාකාරී බවක් ඇති වීම

15. සමන් සහල් ආශ්‍රිත නිෂ්පාදන ආයතනයක හිමිකරුවෙකි. ප්‍රදේශයේ වී ගොවියන්ගෙන් හා රජයෙන් ඔහුට සහාය හිමිවේ. මෙය සමන්ගේ ව්‍යාපාරයට,

(1) ශක්තියකි.
(2) සීමාවකි.
(3) අවස්ථාවකි.
(4) තර්ජනයකි.

16. ව්‍යාපාර එහි ප්‍රමාණය පදනම් කරගෙන වර්ග කිහිපයකට බෙදිය හැකි ය. එම බෙදීමට අනුව අදාළ **නොවන** පිළිතුර තෝරන්න.

(1) මහා පරිමාණ ව්‍යාපාර
(2) කුඩා පරිමාණ ව්‍යාපාර
(3) අධි පරිමාණ ව්‍යාපාර
(4) මධ්‍ය පරිමාණ ව්‍යාපාර

17. කුඩා පරිමාණ ව්‍යාපාරවල ලක්‍ෂණ පමණක් අඩංගු කාණ්ඩය විය යුත්තේ,

(1) රාජ්‍ය මෙහෙය වීම, සාපේක්‍ෂව කුඩා සේවක සංඛ්‍යාව, අඩු ආයෝජනය
(2) රාජ්‍ය මෙහෙය වීම, සාපේක්‍ෂව වැඩි සේවක සංඛ්‍යාව, අඩු ආයෝජනය
(3) පෞද්ගලික හිමිකාරීත්වය, සාපේක්‍ෂව කුඩා සේවක සංඛ්‍යාව, අඩු ආයෝජනය
(4) පෞද්ගලික හිමිකාරීත්වය, සාපේක්‍ෂව වැඩි සේවක සංඛ්‍යාව, වැඩි ආයෝජනය

18. පහත වාක්‍ය අතුරින් නිවැරදි වාක්‍ය තෝරන්න.

(1) බොහෝ මහා පරිමාණ ව්‍යාපාරවල ආරම්භක අවස්ථාව මධ්‍ය පරිමාණ ව්‍යාපාරයකි.
(2) බොහෝ නවෝත්පාදන බිහි වී ඇත්තේ කුඩා පරිමාණ ව්‍යාපාර තුළිනි.
(3) වෙළෙඳපොළ හිදැස හඳුනාගනිමින්, මහා පරිමාණ ව්‍යාපාරිකයෝ වෙළෙඳපොළට පිවිසේ.
(4) මහා පරිමාණ ව්‍යාපාර බොහොමයක ව්‍යාපාර කටයුතු කුඩා ප්‍රදේශයකට සීමා වී ඇත.

19. සත්ත්ව නිෂ්පාදන ආයතනය හිමිකරු වන ළහිරු නිරන්තරයෙන් තම සේවකයින් උනන්දු කරවමින් කටයුතු කරන අතර සේවකයන්ගේ කටයුතු වලට ප්‍රශංසා ලබාදේ. මෙහිදී ළහිරුගේ භූමිකාව විය යුත්තේ,

(1) අයිතිකරුගේ භූමිකාව
(2) කළමනාකරුගේ භූමිකාව
(3) ව්‍යාපාරිකයාගේ භූමිකාව
(4) නායකයාගේ භූමිකාව

20. ව්‍යවසායකයකු සාධාරණව කටයුතු කිරීම, අලාභ ලබන විටදීත්, ව්‍යාපාරය ගොඩනැංවීමට කටයුතු කිරීම ආදී හැකියාවන් කවර කුසලතාවලට අයත් වේද?

(1) ආදර්ශවත්ව කටයුතු කිරීමේ කුසලතාව
(2) මානව කුසලතා
(3) කණ්ඩායමක් සමඟ කටයුතු කිරීමේ කුසලතා
(4) සංකල්පනාත්මක කුසලතා

Education NCP - www.edncp.lk

21. නූතන ව්‍යාපාර පරිසරය තුළ දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

(1) තරඟකාරිත්වය අඩු වීම
(2) ව්‍යාපාරිකයා බලවත් වීම
(3) ගෝලීය වශයෙන් ව්‍යාප්ත වීම
(4) අවශ්‍යතා හා වුවමනා සරල වීම

22. ව්‍යාපාරයක ක්‍රියාකාරිත්වයට අභ්‍යන්තරව හා බාහිරව ධනාත්මක බලපෑම් ඇති කරන සාධක .......................... ලෙස හැඳින්විය හැක.
ඉහත හිස්තැනට වඩාත්ම ගැළපෙන පිළිතුර වන්නේ,

(1) ශක්තීන් හා දුර්වලතාවන්
(2) ශක්තීන් හා අවස්ථාවන්
(3) ශක්තීන් හා තර්ජන
(4) අවස්ථාවන් හා තර්ජන

23. නිමි ඇඟළුම් අලෙවිකරුවකුගේ පාරිභෝගික පිරිස දිනෙන් දින අඩු වූයේ තවත් නිමි ඇඟළුම් අලෙවිසැලක් ඊට ආසන්නව ආරම්භ වූ නිසා ය. මෙම බලපෑම කවර ව්‍යාපාර පරිසරයට අයත් සාධකයක් වේද?

(1) ආසන්න පරිසරය
(2) ප්‍රජා පරිසරය
(3) ආර්ථික පරිසරය
(4) දේශපාලන හා නෛතික පරිසරය

24. විධිමත් අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමයක් පැවතීමෙන් මතු කරගත හැකි ව්‍යාපාර අවස්ථාවක් **නොවන්නේ,**

(1) කාබනික පොහොර නිෂ්පාදනය
(2) දේශීය ඖෂධ වර්ග නිෂ්පාදනය
(3) ප්‍රතිචක්‍රීකරණය තුළින් නව භාණ්ඩ නිපදවීම
(4) පොලිතීන් අපද්‍රව්‍ය භාවිතයෙන් ගඩොල් නිෂ්පාදනය

25. සීඝ්‍රයෙන් වෙනස්වන ව්‍යාපාර පරිසරයේ නව ප්‍රවණතාවක් වන්නේ මින් කවරක් ද?

(1) තාක්ෂණික ක්‍රම හා උපකරණ භාවිතයට නොගැනීම
(2) කෘත්‍රිම ආහාර නිෂ්පාදනය
(3) නවීන අවි ආයුධ නිෂ්පාදනය
(4) නැනෝ තාක්ෂණය තුළින් ඇතිවන ව්‍යාපාර අවස්ථා

Education NCP - www.edncp.lk

***

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

❖ **පළමු** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

01. රුසිරු දුෂ්කර ගමක උපන්නෙකි. ඔහුගේ පියා කුඹල් කර්මාන්තයක යෙදී සිටී. රුසිරු පාසල අවසන් වීමෙන් පසු පියාගේ වැඩවලට උදව් වෙයි. පියාගේ වැඩවලට උදව් වීම නිසාම රුසිරුට දන් කුඹල් කර්මාන්තය දැනට හොඳට හුරුය. රුසිරු අ.පො.ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටීමෙන් පසු පියාගේ කර්මාන්තය ඔහුගේ අතට ගෙන එය වඩාත් දියුණු කිරීමට මඟක් සොයන්නට විය. මෙහිදී ඔහුගේ අවධානය යොමු වූයේ ගැස් වලං කෙරෙහි ය. ඔහු රැස්කර තිබූ මුදල් යොදවා තවත් සකපෝරුවක් මිලට ගෙන පියා සමඟ එකතු වී ගැස් වලං නිපදවා වෙළෙඳපොලට ඉදිරිපත් කරන ලදී. ඔවුන්ගේ ගැස් වලං වලට ඇති වූ ඉල්ලුම තනිව සපුරාලීමට නොහැකි වූ බැවින් තවත් සේවකයින් දෙදෙනෙකු බඳවාගෙන ව්‍යාපාරය පුළුල් කරන ලදී. රුසිරු තුළ පැවති කැපවීම, උනන්දුව, උත්සාහය ටික කලකින් ඔහු ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙකු බවට පත් කළේ ය.

(i) රුසිරු ව්‍යවසායකයෙකු බවට පත්වීමට හේතු වූ සාධක දෙකක් දක්වන්න.
(ii) රුසිරු තුළ පැවති ශක්තීන් දෙකක් ලියන්න.
(iii) රුසිරුගේ අනාගත දැක්ම කුමක් විය හැකි ද?
(iv) රුසිරු තුළ පැවති ව්‍යවසායකත්ව ගුණාංග දෙකක් ලියන්න.
(v) රුසිරුට ලැබෙන සමාජ ප්‍රතිලාභ දෙකක් ලියන්න.

(ලකුණු 2 × 5 = 10)

02. ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ යෙදී සිටින්නා ව්‍යවසායකයා ය. මොවුන් නව අදහස් ජනිත කරයි. නවෝත්පාදන ලෙස අදහස් වන්නේ එම අදහස් ය.

(i) ව්‍යවසායකත්වය යනුවෙන් ඔබට හැඟෙන්නේ කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න.
(ii) (අ) භාණ්ඩ හා සේවා නිපදවීම සඳහා යොදාගන්නා නිෂ්පාදන සම්පත් ප්‍රධාන වශයෙන් සාධක හතරකට බෙදේ. ඒ මොනවා ද?
(ආ) ඒවාට උදාහරණ දෙක බැගින් දෙන්න.
(iii) ව්‍යවසායකයෙකු තුළ පවතින ගති ලක්ෂණ හතරක් ලියන්න.
(iv) ව්‍යවසායකයා නිර්මාණශීලී ය. නිර්මාණශීලීත්වය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
(v) පුද්ගලයෙකුගේ නිර්මාණශීලිත්වයට බාධාකාරී වන සාධක හතරක් සඳහන් කරන්න.

(ලකුණු 2 × 5 = 10)

03. (i) පහත සඳහන් ප්‍රකාශවල සත්‍ය / අසත්‍ය බව දක්වන්න.
(අ) ව්‍යවසායකත්වය වැඩිහිටියන් වීමේ දී ඇතිවන කුසලතාවයකි.
(ආ) ව්‍යවසායකයා ආර්ථිකයේ දියුණුව සඳහා සැලකිය යුතු වෙනසක් කරන්නෙකි.
(ඉ) නිෂ්පාදන සාධක මෙහෙයවනු ලබන්නේ ව්‍යවසායකයා විසිනි.
(ඊ) ඕනෑම පුද්ගලයෙකුට ව්‍යවසායකයෙකු විය හැකි ය.
(ii) නවෝත්පාදනය, ව්‍යවසායකයන් සතු සුවිශේෂී ලක්ෂණයකි. නවෝත්පාදනය සිදුවන ආකාර දෙකක් හා නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න.

Education NCP - www.edncp.lk

(iii) ව්‍යවසායකයා නවෝත්පාදනයේ යෙදෙන විට අවදානමක් ඇත. අවදානම අනුව ඔහුට ප්‍රතිලාභ අත්වේ. මෙම අවදානම හා ප්‍රතිලාභ අතර ඇති සම්බන්ධය පැහැදිලි කරන්න.

(iv) ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර සමානකම් හතරක් ලියන්න.

(v) ව්‍යාපාරිකයා යනු කවුරුන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 2 × 5 = 10)

04. (i) අවශ්‍යතා හා වුවමනා යන්න පැහැදිලි කර, ඒ සඳහා උදාහරණ දෙක බැගින් දෙන්න.

(ii) ව්‍යවසායකත්වය තුළින් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ හතරක් දක්වන්න.

(iii) ව්‍යවසායකයින් වර්ග නම් කොට, උදාහරණය බැගින් දක්වන්න.

(iv) ව්‍යාපාරවල ගති ලක්ෂණ තුනක් දක්වා, ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(v) පුද්ගලයෙකු රැකියාවක නිරතවීමට වඩා ව්‍යවසායකයකු වීමෙන් ලැබිය හැකි ප්‍රතිලාභ හතරක් ලියන්න.

(ලකුණු 2 × 5 = 10)

05. (i) කුඩා පරිමාණ ව්‍යාපාරවල ලක්ෂණ හතරක් නම් කරන්න.

(ii) කුඩා ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු හතරක් සඳහන් කරන්න.

(iii) කුඩා පරිමාණ ව්‍යාපාර තුළ දැකිය හැකි ව්‍යවසායකත්ව භූමිකා නම් කර, ඉන් එකක් පැහැදිලි කරන්න.

(iv) මහා පරිමාණ ව්‍යාපාරවලට සාපේක්ෂව කුඩා ව්‍යාපාර ආශ්‍රිතව හඳුනාගත හැකි ශක්තීන් හතරක් දක්වන්න.

(v) ව්‍යවසායකයෙකු විසින් වර්ධනය කරගත යුතු මූලික කුසලතා හතරක් ලියන්න.

(ලකුණු 2 × 5 = 10)

06. ගතික පරිසරයක් තුළ කටයුතු කරන ව්‍යවසායකයෙකුට පාරිසරික සාධක පිළිබඳ සැළකිලිමත් වීම ඉතා වැදගත් වේ.

(i) ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන බාහිර පරිසර සාධක හතරක් නම් කරන්න.

(ii) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය හා බාහිර පරිසරය අධ්‍යයනය තුළින් අවබෝධ කරගත හැකි දෑ වෙන වෙනම දක්වන්න.

(iii) පරිසර ප්‍රවණතාවලට සංවේදී වීමෙන් ළඟා කරගත හැකි ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න.

(iv) ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන ව්‍යාපාර අංශ නම් කර, එකිනෙක සඳහා එක් උදාහරණය බැගින් ලියන්න.

(v) නිර්මාණශීලී ව්‍යාපාර අවස්ථා මතු කරගත හැකි, ශ්‍රී ලංකාවේ පවත්නා මානව නොවන සම්පත් හතරක් සඳහන් කරන්න.

(ලකුණු 2 × 5 = 10)

***



Education NCP - www.edncp.lk

ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II

10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2019

## ව්‍යවසායකත්ව අධ්‍යයනය I

## ලකුණු දීමේ පටිපාටිය

| | | | |
|---|---|---|---|
| 01 | (3) | 14 | (3) |
| 02 | (2) | 15 | (3) |
| 03 | (3) | 16 | (3) |
| 04 | (4) | 17 | (3) |
| 05 | (3) | 18 | (2) |
| 06 | (3) | 19 | (4) |
| 07 | (1) | 20 | (1) |
| 08 | (3) | 21 | (3) |
| 09 | (1) | 22 | (2) |
| 10 | (3) | 23 | (1) |
| 11 | (1) | 24 | (2) |
| 12 | (2) | 25 | (4) |
| 13 | (2) | | |

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II
## ලකුණු දීමේ පටිපාටිය

01. (i)
- ★ පරම්පරාවෙන් (පියාගේ ආභාෂය)
- ★ අධ්‍යාපනය තුළින් (අත්දැකීම් තුළින්)

(ii)
- ★ ඔහු සතු පළපුරුද්ද
- ★ පියාගේ සහයෝගය
- ★ ව්‍යාපාරික ස්ථානයක් පැවතීම
- ★ ඔහු සතු ධනය

(iii)
- ★ ලංකාවේ හොඳම/ ජනප්‍රියම ගෑස් වලං නිෂ්පාදකයා වීම.
- ★ තමාගේ නිෂ්පාදන විදේශීය වෙළඳපොළට ඉදිරිපත් කිරීම.

(iv)
- ★ කැපවීම
- ★ උනන්දුව
- ★ උත්සහය
- ★ දුර දක්නා නුවණ

(v)
- ★ ප්‍රසිද්ධිය
- ★ පිළිගැනීම
- ★ නායකත්වය

02. (i)
- ★ අනාගතය වෙනස් කිරීමට පොළඹ වන්නා වූ පුද්ගලයන්ගේ මානසික තත්ත්වයකි.
- ★ සිතන, තර්ක කරන හා ක්‍රියාකරන ආකාරයකි.
- ★ පුද්ගලයන්ගේ ධනාත්මක ආකල්ප, හැසිරීම් හා කුසලතා පිළිබඳ එකතුවකි.
- ★ මිනිස් චින්තනය හා බැඳුණකි. (මනෝභාවයකි)
- ★ සහජයෙන් උරුම විය හැකි මෙන්ම අධ්‍යාපනය හා පළපුරුද්ද තුළින් සකස් කර ගත හැකි හා වර්ධනය කර ගත හැකි දෙයකි.

(ii) (අ)
- ★ ශ්‍රමය, භූමිය, ප්‍රාග්ධනය, ව්‍යවසාය

(ආ)
- ★ ශ්‍රමය - වඩු කාර්මිකයන්ගේ ශ්‍රමය, ඉංජිනේරුවාගේ ශ්‍රමය
- ★ භූමිය - වනාන්තර, පස, ඉඩම්, අමුද්‍රව්‍ය
- ★ ප්‍රාග්ධනය - ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර, උපකරණ
- ★ ව්‍යවසාය - සාධක සංකලනය කරන්නා (වඩුවා/ පෙදරේරුවා)

(iii)
- ★ නිර්මාණශීලිත්වය
- ★ නවෝත්පාදනය
- ★ අවදානම් භාර ගැනීම
- ★ අනාගත දැක්ම
- ★ සුභවාදී වීම
- ★ පරිසර සංවේදී බව හා අවස්ථා හඳුනා ගැනීම
- ★ අසීරු අරමුණු ඉටු කර ගැනීම කෙරෙහි ඇති නැඹුරුව
- ★ ස්වාධීනත්වය
- ★ නම්‍යශීලීත්වය

(iv) ගැටළු හා අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් ලෙස නව අදහස් සංවර්ධනය කිරීමට හෝ නව මාර්ග සොයා ගැනීමට ඇති හැකියාව නිර්මාණශීලිත්වය යි.

(v) ★ විශ්වාස හා ආකල්ප කෙරෙහි තද බල ලෙස ගැලී සිටීම
★ යම් ගැටළුවකට එකම විසඳුමක් පමණක් ඇතැයි සිතීම
★ ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම
★ තර්කානුකූල පදනමක පිහිටා කටයුතු කිරීම
★ ප්‍රායෝගික වීමට බාධා ඇතැයි සිතීම
★ රීති හා සම්ප්‍රදාය අනවබෝධයෙන් පිළිපැදීම
★ වැරදීම් හා විවේචන සඳහා ඇති බිය

03. (i) (අ) අසත්‍යයි. (ආ) සත්‍යයි.
(ඉ) සත්‍යයි. (ඊ) අසත්‍යයි.

(ii) නවෝත්පාදනය සිදුවන ආකාර
★ නව සොයා ගැනීමක්
★ දිගුවක්
★ අනුකරණය කිරීමක්
★ සංකලනයක්

නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍ර
★ අනපේක්ෂිත සිදුවීම
★ ක්‍රියාවලි අවශ්‍යතා
★ වෙළඳපොළේ වෙනස් වීම්
★ ප්‍රජා පරිසරයේ හා ජන ජීවිතයේ වෙනස්කම්
★ සංජනනය හෙවත් තේරුම් ගන්නා ආකාරය වෙනස් වීම
★ දැනුම පදනම් කරගත් සංකල්ප

(iii) ★ අවදානම ඉහළ නම් ප්‍රතිලාභය ද ඉහළ වේ.
★ අවදානම පහළ නම් ප්‍රතිලාභය ද පහළ වේ.

(iv) ★ ආර්ථික කටයුත්තක යෙදීම
★ අවදානමකට මුහුණදීම
★ ගනුදෙනුවල නිරත වීම
★ සම්පත් භාවිතා කිරීම
★ තරගයට මුහුණදීම
★ පැවැත්ම ගැන සිතීම
★ ස්වයං පෙළඹ වීමක් තිබීම
★ නිෂ්පාදනය මිලදී ගැනීම හා විකිණීම සම්බන්ධ තීරණ ගැනීම

(v) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම, බෙදාහැරීම හා සම්බන්ධ වූ සියලුම කටයුතුවල නියැලි පුද්ගලයන් ව්‍යාපාරිකයන් ලෙස හැඳින්වේ.

04. (i) අවශ්‍යතා - මිනිසාගේ ජීවිතය පවත්වා ගෙන යාමට අනිවාර්යෙන්ම සපුරා ගත යුතු දෑ
වුවමනා - මිනිසාගේ අවශ්‍යතා සපුරා ගැනීමට යොදා ගන්නා විවිධ ස්වරූප

අවශ්‍යතා - ආහාර පාන, ඇඳුම් පැළඳුම්, නිවාස
වුවමනා - බත්/ පාන්/ ගවුම්/ කිරි

(ii)
- ★ දේශීය සම්පත් උපයෝජනය කිරීම
- ★ ප්‍රාදේශීය සංවර්ධනය සිදුවීම
- ★ රැකියා අවස්ථා ජනනය වීම
- ★ නව භාණ්ඩ හා සේවා වෙළඳපළට ඉදිරිපත් වීම
- ★ ආදායම් බෙදී යාමේ විෂමතාව අඩු වීම
- ★ රටේ සමස්ථ නිෂ්පාදනය ඉහළ යාම

(iii) ව්‍යාපාර ව්‍යවසායකයෝ - සිල්ලර වෙළෙන්දා, තොග වෙළෙන්දා
සාමාජීය ව්‍යවසායකයෝ - මහත්මාගාන්ධි, සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා
අභ්‍යන්තර ව්‍යවසායයෝ - ඵලදායිතා සම්මාන හිමි කරගත් ආයතන ප්‍රධානින්

(iv)
- ★ ව්‍යාපාරයේ සම්පත් ගනුදෙනුවල යෙදවීම.
- ★ ගනුදෙනු අඛණ්ඩව සිදුවීම.
- ★ අරමුණක් පැවතීම.
- ★ අවදානමක් පැවතීම.
- ★ මිල මත ගනුදෙනු සිදුවීම.
- ★ ආර්ථික කටයුත්තක් වීම.

(v)
- ★ කාර්යන්හි විවිධත්වයක් ඇති වීම.
- ★ ආකර්ෂණීය ලාභ ඉපයීම.
- ★ ස්වයංපෝෂිත බව
- ★ සමාජීය සුභසාධනයට දායක විය හැකි වීම.
- ★ නිදහස හා ඉහළ තෘප්තිය.

05. (i)
- ★ කුඩා ප්‍රාග්ධනයක් යොදා තිබීම.
- ★ සේවක සංඛ්‍යාව අඩු වීම.
- ★ ව්‍යාපාරය තනි අයිතිකරුවෙකු සතු වීම.
- ★ තීරණ ගැනීමට ඇති පහසුව.
- ★ කුඩා ප්‍රදේශයකට සීමා වීම.

(ii)
- ★ මූල්‍ය පාලනය දුර්වල වීම.
- ★ තරඟකාරීත්වයට මුහුණදීමේ අපහසුව.
- ★ ව්‍යාපාර කටයුතු සැලසුම් වලින් තොර වීම.
- ★ දුර්වල මානව සම්බන්ධතා
- ★ පවතින සම්පත් නිවැරදිව පාලනය නොකිරීම.

(iii)
- ★ අයිතිකරුගේ භූමිකාව
- ★ නායකත්ව භූමිකාව
- ★ කළමණාකරණ භූමිකාව

(iv)
- ★ සීමිත ප්‍රාග්ධනයකින් වුවද ආරම්භ කළ හැකි වීම.
- ★ රජයෙන් ලැබෙන විශේෂ දිරි ගැන්වීම.
- ★ දේශීය තාක්‍ෂණය වුවද භාවිත කළ හැකි වීම.
- ★ පවුලේ සාමාජිකයින්ගේ සහභාගිත්වය ලබාගත හැකි වීම.
- ★ ගතික පරිසරයට ක්‍ෂණික ප්‍රතිචාර දැක්වීමේ පහසුව.

(v)
- ★ තාක්‍ෂණ කුසලතා
- ★ මානව කුසලතා
- ★ සංකල්පනාත්මක කුසලතා
- ★ සන්නිවේදන කුසලතා
- ★ උපදේශන කුසලතා
- ★ ආදර්ශමත්ව කටයුතු කිරීමේ කුසලතා

06. (i)
- ★ ආසන්න පරිසරය
- ★ ප්‍රජා පරිසරය
- ★ ආර්ථික පරිසරය
- ★ දේශපාලන හා නෛතික පරිසරය
- ★ විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරය
- ★ ස්වාභාවික පරිසරය

(ii) අභ්‍යන්තර පරිසරයෙන් -
- ★ ව්‍යාපාරය සතු ශක්තීන්
- ★ ව්‍යාපාරය සතු දුර්වලතා

බාහිර පරිසරයෙන් -
- ★ ව්‍යාපාරය වෙත ඇති අවස්ථා
- ★ ව්‍යාපාරය වෙත ඇති තර්ජන

(iii)
- ★ නව ආදායම් මාර්ග සකස් කර ගැනීමේ හැකියාව වැඩි කර ගැනීම සඳහා
- ★ වෙළඳපොළ තුළ තරඟකාරීත්වයට සාර්ථකව මුහුණදීම සඳහා
- ★ පරිසරය තුළ මෙතෙක් ප්‍රයෝජනයට නොගත් සම්පත් භාවිත කිරීමට
- ★ සාර්ථක ව්‍යාපාරික අවස්ථා ග්‍රහණය කර ගැනීමට
- ★ පාරිසරික ගැටළු අවම කර ගැනීමට
- ★ ආවේණික සම්පත් සුරැකීමට

(iv)
- ★ ප්‍රාථමික අංශය -
  - ★ කෘෂි හා ගොවිපළ කර්මාන්තය
  - ★ ධීවර
  - ★ පතල් හා කැණීම්
- ★ ද්විතීකයික අංශය -
  - ★ නිමැවුම්
  - ★ ඉදිකිරීම්
- ★ තෘතියික අංශය -
  - ★ වෙළඳාම (තොග, සිල්ලර)
  - ★ උපකාරක සේවා

(v)
- ★ ස්වාභාවික සම්පත් (ජලය, දියඇලි, ගංගා, මුහුදු වෙරළ)
- ★ ඛණිජ සම්පත්
- ★ සංස්කෘතික සම්පත්
- ★ ස්වභාවික වනාන්තර

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පොත් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**
**Learn Ordinary Level**

LOL.lk online Book Store

අමතන්න - 071 777 4440/0756999990/071 8540371














































Online shopping

**www.lol.lk**
**Learn Ordinary Level**

DELIVERY ISLANDWIDE | SECURE PAYMENT

LOL.lk
online Book Store
071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## කෙටි සටහන් පොත්




වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

# PAST PAPERS WIKI

## ප්‍රශ්නපත්‍ර පොත් ගෙදරටම ගෙන්වා ගන්න ඔන්ලයින් ඕඩර් කරන්න

## WWW.LOL.LK වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA MasterCard DISCOVER NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE

An evening of fun for young readers


